# ජපන් මහායාන බෞද්ධ සංස්කෘතියේ මූර්ති ශිල්පීය තාක්ෂණික ක්‍රමවේදයට හා චාරිත්‍ර විධීන්ට ශ්‍රී ලාංකික බලපෑමක් වූයේ ද?

ආචාර්ය නිමල් සේනාරත්න[1]

## හැඳින්වීම

ජපානයට බුදුසමය හඳුන්වා දෙනු ලැබූයේ ක්‍රි. ව. 538 පමණ යමතො යුගයේ මධ්‍යතන අවධියේ දීය. යමතො යුගය ක්‍රි. ව. 300 - 700 අතර කාලයට අයත් වේ. එතැන් සිට කාල වකවානු තුළ විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් මහායාන බුදුසමය ජපානයේ ස්ථාවර ආගම බවට පත්විය.

මෙම කාල වකවානුව තුළ සමස්ත ජපන් සමාජයම බෞද්ධ සංස්කෘතික බලපෑමට නතු වී විවිධ ක්ෂේත්‍රවල නව නිපැයුම් රැසක් ජපන් සාම්ප්‍රදායික සංස්කෘතික උරුමයන් බවට පත්වීමට කාලය හා දේශය විසින් අවශ්‍ය පාරිසරික බලපෑම් ඇති කරනු ලැබීය.

'ලොව ඕනෑම ජන සමාජයක සමාජගත සාදක ආගමික චින්තන විධි හැඩගැස්වීමට බලපානු ලැබේ.' ආර්ථික විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ ජපානයේ විශේෂඥයෙකු වූ ෂුපි හයෂි පවසන්නේ 'ඕනෑම පරිබාහිර දෙයක් ජපනීකරණය කොට අවශ්‍ය නව ක්‍රම සහ විසඳුම් සෙවීමට ජපන් ජාතිකයන් සමත් වන' බවයි. ඉන්දියානු ප්‍රභවයෙන් අභාසය ලබා, චීනය හා කොරියාව ඔස්සේ ජපානය විසින් හඳුනාගනු ලැබූ බෝධිසත්ත්ව සංකල්පයට නව අර්ථ කථන සංයෝග කර ගැනීමට ජපන් ප්‍රතිමා හා කලා නිර්මාණ ශිල්පීහු මහත් පරිශ්‍රමයක් දරා ඇත.

වර්තමානය වන තෙක් ජපානයේ ආගමික භේදයකින් තොරව ප්‍රබල බලපෑමක් ඇතිකර ඇති අවලෝකිතේශ්වර / කන්නොන් බෝධිසත්ත්ව විශ්වාසය හා වැඳුම් පිදුම් ක්‍රම ආශ්‍රිතව බිහි වූ ප්‍රතිමා හා කලා ශිල්පීය ක්ෂේත්‍රය තුළ ජපනීකරණය වූ විදේශීය බලපෑම් රැසක් හඳුනාගෙන ඇත.

අග්නිදිග ආසියාතික, මධ්‍ය ආසියාතික හා පෙරදිග රටවල් අතර ඉපැරණි යුගයේ සිට ඇති වූ එකිනෙක බලපෑම් ගැන ශාස්ත්‍රීය විමර්ශන රැසක් හමු වේ. මේ අතරතුර පෙරදිග රටවලට ඇති වූ ශ්‍රී ලාංකික බලපෑම් ගැන විවිධ විද්වතුන් යම් යම් ඉඟි පළකර ඇති අවස්ථා ද දක්නට ලැබේ. විශේෂයෙන් විද්වතුන් කිහිප දෙනෙකු විසින් රෝලන්ඩ් සිල්වා සමරු කලාපයට හා සෙනරත් පරණවිතාන සමරු කලාපයට සපයා ඇති ශාස්ත්‍රීය ලිපිවලින් ඉපැරණි ලී කැටයම් ආශ්‍රිත ගෘහ

1 nimal.sena@gmail.com

නිර්මාණ ශිල්පය තුළ මධ්‍ය ආසියාතික හා පෙරදිග රටවල සම්බන්ධතා තිබිය හැකි බවට යම් යම් ඉඟි පළකර ඇත.

ශ්‍රී ලංකාවේ හමු වූ මංජුශ්‍රී භාෂිත චිත්‍ර කර්ම ශාස්ත්‍ර හා වාස්තු විද්‍යා ශාස්ත්‍ර නැමැති ප්‍රතිමාකරණ තාක්ෂණවේදී ග්‍රන්ථය එම විෂයයට අයිති ලොව පැරණිතම ග්‍රන්ථය බව විද්වතුන් පිළිගෙන ඇති අතර, එය ශ්‍රී ලාංකික ග්‍රන්ථයක් බවද දැන් පිළිගෙන අවසානය. එය ක්‍රි. ව. 5 වැනි හා 7 වැනි සියවස් කාලයට අයත් වේ.

**දත්ත සහ විශ්ලේෂණ**

අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමා වල ජටාමකුටයෙහි ඉදිරිපස අමිතාභ බුදුරුව නිර්මාණය කර තිබීම ජපානයේ හා ශ්‍රී ලංකාවේත් අනෙකුත් අනිවාර්ය ලක්ෂණය වීය. එසේම කරුණාවේ හා දයාවේ ස්වභාවය මූර්තිමත් කිරීම මූලික අපේක්ෂාව වීය. එසේ වුවද එකම බෝධිසත්ත්ව සංකල්පය රටවල් දෙකක ද්විත්ව චින්තන දෘෂ්ඨියක් නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකික ප්‍රතිමාවල භාරතීය ආභාසය දැකිය හැකි වූවත්, ශ්‍රී ලංකික මූර්ති ශිල්පීය දේශීය සිද්ධාන්ත හා නියමයන් ද අනුගමනය කර ඇත. ජපන් නිර්මාණ ශිල්පීන් ද චීන, කොරියන් ආභාසය ලබාගෙන අනතුරුව භාරතීය හා වෙනත් නියමයන් ද අනුගමනය කිරීමට වෙහෙස දරා ඇත. මංජුශ්‍රී භාෂිතය වැනි සංස්කෘත භාෂාවෙන් ලියා ඇති තාක්ෂණවේදී ග්‍රන්ථය සමග තුලනය කරන විට එය හෙළිකර ගත හැකිය. ක්‍රි. ව. 10-11 සියවස්වල මැටි මිශ්‍ර වාත්තු ක්‍රමය සහිත ප්‍රතිමා නිර්මාණය ජපානයේ ප්‍රචලිත වීය. (මඤ්ජුශ්‍රී භාෂිතයේ දක්වෙන එක් විධි නියමයක් වූ

රජ්ජුකර්ම විධානන්තු - ප්‍රවක්‍ෂ්‍යාම්‍යානුපූර්වශඃ
රන්ධ්‍රාච පිංගලා චෛව - සුෂුම්නා මධ්‍යපාරශ්වගඃ
ශුජංග යසිත ඉව(භ්‍යා) සුෂුම්නා ශුලමාවෘතම්
වංශදණ්ඩ(ස්‍ය) පුං බ්‍රහ්මා - නාඩි මූර්ධාන්තමිෂ්‍යතෙ)

ක්‍රි. ව. 7, 8, 9 හා 10 වන ශතවර්ශවල මහායාන ඉගැන්වීම් ශ්‍රී ලංකාවේ ප්‍රබල ලෙස ව්‍යාප්ත වී යාමේ ප්‍රතිඵලයක් වශයෙන් තත්කාලය තුළ මහායාන බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය ද වර්ධනය වීය.

ලීයෙන් සාදා මැටි බදාමයකින් ආවරණය කරතිබූ අවලෝකිතේශ්වර ප්‍රතිමාවක් ලංකාවේ සිට තිබ්බතයට ගෙන ගිය පුවතක් ගැන සඳහන් වේ. එම ප්‍රතිමාව යාපහුවේ පඬුවස් නුවරින් හමුවූ එකක් බව ද සැලකේ.

ජපානයේ කමකුරා යුගයේ (1185-1333) ප්‍රතිමා ආශ්‍රිතව පැවති පුද පූජා සිරිත්වලට මංජුශ්‍රී භාෂිතයේ විධි නියමයන් බලපා ඇති ආකාරය සනාථ කිරීම (මෙහිදී ජපානයේ හසෙ ප්‍රකාශන හා හසෙ කෞතුකාගාරයේ ඇති ඉපැරණි ලේඛන හා චිත්‍ර උපයෝගී කරගැනේ.) බ්‍යාකුළු කන්නොන් ප්‍රතිමා ආශ්‍රිත ලක්ෂණ සනාථ කිරීම. (මංජුශ්‍රී භාෂිතයේ 16වන පරිච්ඡේදය ආශ්‍රිතව) දඹේගොඩ බෝධිසත්ත්ව ප්‍රතිමාව සමග ජපන් ෂෝ කන්නොන් හා ජූ ඉචිමෙන් කන්නොන්

ප්‍රතිමාවල ඇති සමානතා විශ්ලේෂණය කිරීම. ජපනයේ මෛත්‍රී බෝධිසත්ත්ව ප්‍රතිමාවල ලක්ෂණ, මංජුශ්‍රී භාෂිතයේ 16වන අධ්‍යායයේ විධි නියමන් හා විශ්ලේෂණය කිරීම.

ප්‍රතිමා නිර්මාණය සඳහා වෘක්ෂ ඡේදනය පිළිබඳව ඇති මංජුශ්‍රී භාෂිත විධි නියම ජපානයේ පවතින සිරිත් විරිත් සමග සංසන්දනය කිරීම. විශේෂයෙන් තනි ලීයෙන් තනි ප්‍රතිමාවක් නිර්මාණය කිරීම පිළිබඳ ඉපැරණි ක්‍රමවේදය සමග විශ්ලේෂණය කළ හැකිය. විවිධ අවස්ථාවල පුරාවිද්‍යා කැනීම්වලින් සොයාගත් මැටි රූප ආශ්‍රිත නෂ්ටාවශේෂ තුළ ඉපැරණි ලොකයේ මැටි රූප කලාව සමග සමානතා තිබෙන බව මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන මහතා සම්මුඛ සාකච්ඡාවක දී හෙළි කර ඇත. ප්‍රතිමා සඳහා මැටි මිශ්‍රණය සාදා ගැනීමේ තාක්ෂණික ක්‍රමවේදය හා ප්‍රතිමා සැකිල්ල නිර්මාණය කිරීමේ ක්‍රමවේදය ද මංජුශ්‍රී භාෂිතයේ නියම කර තිබේ. මඤ්ජු ශ්‍රී භාෂිතයේ 12 සහ 13 වැනි අධ්‍යායයේ දැක්වෙන විධි නියමයන් හා ඒ ආශ්‍රිත චාරිත්‍ර වාරිත්‍ර ජාපනයේ අනුගමනය කර ඇත.

ශ්‍රී ලංකාවේ හා ජපානයේ වෙරළබඩ, නැව් තොටු හා ගංග නදී ආශ්‍රිතව අවලෝකිතේශ්වර ප්‍රතිමා රැසක් ඉදි වී ඇති අතර ඒ පිළිබඳව සොයාගෙන ඇති සාධක විශ්ලේෂණය කරමින් සාකච්ඡා කෙරේ. මෙහිදී දෙරටේම භූගෝලීය හා සමාජ සංස්කෘතික පරිසරය ද අධ්‍යයනය කෙරේ. (ජපානය සම්බන්ධයෙන් නැගෙනහිර හා බටහිර වෙරළ තීරය ජපානයේ නැව් තොටු හා ගංගා නදී ආශ්‍රිතව අවලෝකිතේශ්වර ප්‍රතිමා රැසක් ඉදි වී ඇති ස්ථාන හඳුනා ගැනීමට හැකිවින. ජපානයේ 'අවලෝකිතේශ්වර 33' සංකල්පය පදනම් කරගෙන ඉදි වූ ස්ථාන ඉදිරිපත් කෙරේ. ප්‍රතිමා නිර්මාණය කිරීමට අදාළ වෘක්ෂ - දැව ලබා ගැනීම හා තෝරාගැනීම ආශ්‍රිතව ජපානයේ පවතින සිරිත් විරිත් මඤ්ජුශ්‍රී භාෂිතයේ විධි නියමයන් හා සංසන්දනය කිරීම.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මහාචාර්ය ඔස්මන්ඩ් බෝපෙආරච්චි හා මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් සවිස්තර විශ්ලේෂණයක් හඳුන්වා දී ඇත.

ඓතිහාසිකව දක්නට ලැබෙන ඉහත ඉදිරිපත් කළ සාදෘෂ්‍යතාවලට අමතරව වර්තමාන නව ප්‍රවණතා තුළින් දැකිය හැකි බලපෑම් ද ඉදිරිපත් කළ හැකි වේ.

දකුණු ජපානයේ සෝද් දූපතේ 1964 දී ඉදිකර ඇති 'මහා අවලෝකිතේශ්වර' ප්‍රතිමාව හා විහාරය ශ්‍රී ලංකාවේ 'සහෝදර පන්සලක්' ලෙස සැලකේ. මෙම අවලෝකිතේශ්වර ප්‍රතිමාවේ ශ්‍රී ලංකාවෙන් පූජා කරන ලද දන්ත ධාතූන් වහන්සේ නමක් නිදන් කර ඇති බව සඳහන් වේ. එසේම එම අවලෝකිතේශ්වර ප්‍රතිමාව ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ පූජාවිධි හා චාරිත්‍ර ද අනුගමනය කෙරේ.

ශ්‍රී ලංකාව ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායට අයත් වූ රටක් වුවත්, ඉතිහාසයේ ඇතැම් යුගවලදී වරින් වර මහායානික බෞද්ධ සංස්කෘතියේ බලපෑම්වල ආභාසය

ද ලබාගෙන ඇත.[4] මෙම සම්ප්‍රදායයන් දෙකේම සංකලනයෙන් බිහිවූත්, ඇතැම්විට ස්වාධීනවූත්, ප්‍රතිමා නිර්මාණ ශිල්පීය ක්‍රමවේදයක් ශ්‍රී ලංකාවේ දක්නට ලැබේ. මඤ්ජු ශ්‍රී භාෂිතයෙන් හෙළි කරනු ලබන්නේ එසේ සංවර්ධනය වූ එක් එක් යුගයන්හි ජනප්‍රියත්වයට පත් ශිල්පීය ගුරු කුලයන්හි තාක්‍ෂණික ක්‍රමවේදය වේ.

භාරතීය ශිල්ප ග්‍රන්ථයන්ගේ ආරම්භක අවස්ථාව ක්‍රි.ව. 10 වන සියවසින් එපිටට ගෙනයා නොහැකි බව පිළිගෙන ඇති අතර, මඤ්ජු ශ්‍රී භාෂිතය ක්‍රි.ව. 5-7 යන සියවස්වලට අයත් බවද පිළිගෙන ඇත.

**නිගමනය**

ශ්‍රී ලංකාවේ හා ජපානයේ කළ ක්ෂේත්‍ර ගවේෂණයේ දීත්, දෙරටේම මූලාශ්‍ර පරිශීලනය කිරීමේදීත්, අදාළ ක්ෂේත්‍රයේ විද්වතුන් සමග හා ජපානයේ සාම්ප්‍රදායික ශිල්පීන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේදීත් සොයාගත් දත්ත තුලනාත්මකව විශ්ලේෂණය කර සම්පිණ්ඩනය කිරීමේදී පැහැදිලි වන්නේ ජපාන මහායාන බෞද්ධ සංස්කෘතියේ මූර්ති ශිල්පීය තාක්‍ෂණික ක්‍රම වේදය තුළ හා චාරිත්‍රවිධීන් තුළ ශ්‍රී ලාංකික ආභාසයක් දැකිය හැකි බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ධම්මාලෝක හිමි, ජම්බුගහපිටියෙ. (2012) **මංජු ශ්‍රී භාෂිත චිත්‍රකර්ම ශාස්ත්‍රය ප්‍රස්තාවනාව**, කොළඹ: සමයවර්ධන. 11 හා 43 පිටු.

Koboyashi, Takeishi. (1975). *Nara Buddhist Arts:Todaiji*, Tokyo, p 23-29.

Bopearachchi, O. (2013). "Sri Lanka and the Maritime Trade: the impact of the Role of the Boshisattva Avalositesvara as the Protector of Mariners." *Dans Asian Encounters Networks of Cultural Interaction*. Ed. P. Dhar and U. Singh. New Delhi, p 17 (in print).

Paranavitana, S.(December 1928 – February 1933) "Mahayana in Ceylon", *Ceylon Journal of Sciences*. Vol II, pp 35-71.

Paranavitana, S. (1948). *Epigraphica Zeylanica*. Vol IV. Colombo, p 157.